www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: මහජන සහයෝගය දිය වී යන තතු තුල ජවිපෙ තුල විෂකුරු කාකොටා ගැනීමක්

## Sri Lanka: Acrimonious feuding inside JVP as party's support slides

**කේ. රත්නායක විසිනි**

**2008 අප්‍රේල් 22**

සිංහල වර්ගෝත්තමවාදය ද දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි ඇරඹූ යුද්ධය සඳහා පුදන සෝෂාබද්ධ සහයෝගය ද සමග ජනතාවාදී වාචාලත්වය සංයෝග කරන ශ්‍රී ලාංකික පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) තුල කටුක කන්ඩායම්වාදී භේදයක් පිපිරී ඇත. පුද්ගලික අපවාද, සංවිධානමය උපාමාරු, අධිකරන ක්‍රියාමාර්ග හා ප්‍රචන්ඩත්වය යනාදිය මතභේදය තුල ආධිපත්‍යය දරන නමුදු ආතතීන් මගින් පිලිබිඹු කෙරෙන්නේ සමස්තයක් ලෙස දිවයින ම අලලා ගෙන ඇති ගැඹුරට ම විහිදුනු දේශපාලන හා සමාජ අර්බුදය යි.

මතභේද ප්‍රසිද්ධියේ ඉස්මත්තට පැමිනියේ අප්‍රේල් 8 දා ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ පක්ෂ නායකත්වයට විරුද්ධව පාර්ලිමේන්තුවේ දී රුදුරු විවේචනයක් දියත් කිරීමත් සමග ය. පෙනී යන පරිදි පක්ෂ නායක සෝමවංශ අමරසිංහගේ පෙලඹවීම යටතේ ජවිපෙ මධ්‍යම කාරක සභාව පසුගිය මාසයේ දී වීරවංශට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ. එතැන් පටන් වීරවංශට සෙසු ජවිපෙ මන්ත්‍රීවරු නවයකගේ සහයෝගය ලැබෙන අතර ඔහු සිය දේශපාලන අභිලාෂයන් සපුරා ගැනීමේ වාහකයක් ලෙස දේශප්‍රේමී පෙරමුනක් තැනීමට යෝජනා කර ඇත.

පක්ෂය විවෘත භේදයක් කරා වේගයෙන් තල්ලු වෙමින් තිබේ. පසුගිය දෙසතිය තුල දී, විපරීමතධාරී මන්ත්‍රීවරුන්ට අයත් වාහන දෙකක් පැහැර ගෙන ජවිපෙ මූලස්ථානය වෙත රැගෙන විත් තිබේ. අදාල මන්ත්‍රීවරු පාර්ලිමේන්තු පොලීසියට පැමිනිලි කරමින් ප්‍රතිචාර දක්වා ඇති අතර ජවිපෙ මන්ත්‍රී ජයන්ත වීරසේකර සහ තවත් දෙදෙනෙකු අත් අඩංගුවට ගැනීමට එය තුඩු දී ඇත. තවත් විපරීමතධාරී මන්ත්‍රීවරයකු වන සමන්සිරි හේරත්ගේ නිවසට ප්‍රහාරයක් එල්ල වී ඇති අතර එය ජවිපෙ මැරයන් විසින් සිදු කරන ලද්දක් යැයි සැක කෙරෙයි. වීරවංශට සහයෝගය දෙන බවට වාර්තා වන ජවිපෙ පෙරමුනු සංවිධානයක් වන දේශහිතෛෂී ජාතික ව්‍යාපාරයේ (දේජාව) සංවිධායකවරු දෙදෙනෙකුට ද පහර දී තිබේ.

භේදයට පිටුපසින් පවත්නා ක්ෂනික කාරනාව නම් ආන්ඩුව කෙරෙහි පක්ෂය දක්වන ආකල්පය යි, එනම් පාලක සභාගයට එකතු වනවාද නැතිනම් විපක්ෂයේ ම දිගට ම රැඳී සිටිනවාද යන වගයි. 2005 නොවැම්බරයේ දී ජනාධිපතිවරනය යන්තමින් ජයගැනීමට මහින්ද රාජපක්ෂට සහයෝගය දීමෙහි ලා ජවිපෙ තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කල අතර දිවයින යලි යුද්ධයට තල්ලු කිරීමෙහි ලා තමන් කේන්ද්‍රීය කාර්යභාරයක් සිදු කල බවට එය පුරසාරම් දොඩයි. එමෙන් ම ආන්ඩුවෙන් ඈත්ව සිටීමට ද රාජපක්ෂගේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) සහභාගි නොවීමට ද ජවිපෙ තීන්දු කලේ ය.

ජවිපෙ ආකාරගත ආකාරයට විපක්ෂයේ කොටසක්ව සිටියත් හෙලත්තාඩු ආන්ඩුවට මුක්කු ගැසීමෙහි ලා එම පක්ෂය තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉෂ්ට කර තිබේ. 2002 සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් එල්ටීටීඊයට විරුද්ධව ගෙන ගිය මිලිටරි ආක්‍රමනික ප්‍රහාරයන්ට ද ජනවාරියේ දී අවසානයේ එම ගිවිසුම අහෝසි කිරීමට ද ජවිපෙ මන්ත්‍රීවරු 37 දෙනා සහයෝගය දී ඇත. ආන්ඩුවේ රුදුරු හදිසි නීති බලතල දීර්ඝ කිරීමට ඡන්දය දී ඇති ඔවුහු ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ආන්ඩුවේ ප්‍රහාර අනුමත කොට වැඩ කරන ජනතාව මත යුද්ධයේ ආර්ථික බර පටවා ඇති අයවැය යෝජනාවලට ද සහයෝගය දී තිබේ. යුද්ධයට ද ජීවන මට්ටම් මත එහි බලපෑමට ද එරෙහිව පුලුල්ව පැතිර ඇති මහජන වෛරය ආන්ඩුවේ පමනක් නොව ජවිපෙ ද සහයෝගී පදනම්වල තියුනු කඩා වැටීමක් නිර්මානය කර ඇත.

රාජපක්ෂ ආන්ඩුවට එක්විය යුතු බවට වීරවංශ හා ඔහුගේ ආධාරකරුවන් දිගින් දිගටම බල කර තිබේ. ඉරිදා රාත්‍රියේ දෙරන රූපවාහිනී නාලිකාවේ කතා කරමින් ඔහු පැහැදිලි කල පරිදි, පසුගිය වසර කිහිපය මුලුල්ලේ පක්ෂ සාමාජිකත්වය තියුනු ලෙස කඩා වැටීම

ආපසු හරවා ගන්නේ කෙසේ ද යන වග ජවිපෙ නායකත්වය සාකච්ඡා කරමින් සිට ඇත. “මගේ අදහස වුනේ ආන්ඩුවට ඇතුලු වී සමහර ජනතා-හිතැති වැඩකටයුතුවල යෙදීමයි. එමගින් අපට මහජන පදනමක් තනා ගැනීමට හැකි වනු ඇත” යයි වීරවංශ ප්‍රකාශ කලේ ය. “මගේ තර්කය වූයේ අප ආන්ඩුවෙන් වෙන්ව වැඩ කල හොත්, අපි පිටත සිටින නිසා, කොටින්ට විරුද්ධ යුද්ධයේ ජයග්‍රහනවල වාසිය මහින්ද රාජපක්ෂ ගනු ඇති බව යි. . . . කොහොම වුනත් යුද්ධය යලි ආරම්භ කීරීමට මූලිකත්වය ගත්තේ අපියි.”

යුද්ධයේ සෝෂාබද්ධ ආධාරකරුවකු ලෙස කුප්‍රකට විරවංශ රාජපක්ෂගේ කැබිනට් මන්ඩලය තුල තමා වෙනුවෙන් තැනක් ඇති බව පැහැදිලිව ම දකී. ඔහුට හා ඔහුගේ ආධාරකරුවන්ට ඇමති තනතුරු මුලුමනින් ම පාහේ සහතික කෙරී ඇත. ඒ මක් නිසා ද කියතොත්, ඔවුන්ගේ සහයෝගය රැක ගනු වස් තම සන්ධානයේ සෑම සාමාජිකයකුට ම නිල තනතුරක් දීමට රාජපක්ෂට බල කෙරී ඇති බැවිනි.

අප්‍රේල් 8 දා පාර්ලිමේන්තුවට කල සිය ප්‍රකාශය තුල දී, විරවංශ, තමන් සිය තනතුරෙන් ඉවත් කිරීමට පක්ෂය ඇතුලත පැවති “කුමන්ත්‍රනයක්” ගැන සඳහන් කරමින් එයට පහර ගැසීය. තමන් “අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයක් සහිත” සතුරන්ගේ ගොදුරක් වූ බව ද ඔහු කියාපෑවේ ය. ඉරිදා දිවයින පත්‍රයට කල අදහස් දැක්වීමක දී එම තේමාව වර්ධනය කරමින් ඔහු කියා සිටියේ, පක්ෂය තුල සිටින “කුමන්ත්‍රනකරුවන්” “එක්සත් ජාතික පක්ෂයේ බලවේගත් බටහිර බලවේගත් සමග අත්වැල් බැඳගෙන ඇති” බව යි. පක්ෂ නායකත්වය එජාපය බලයට ගෙන ඒමේ න්‍යාය පත්‍රයක් අනුගමනය කරන බව ද ඔහු ප්‍රකාශ කලේ ය.

වීරවංශගේ වාග් ප්‍රහාරය පිලිබිඹු කලේ යුද්ධයේ වඩාත්ම උමතු සහගත ආධාරකරුවන්ගේ දෘෂ්ටිය යි. ඔවුන් සලකන්නේ මිලිටරියේ මර්දනකාරී පිලිවෙත් හා ජනඝාතන පිලිබඳව මොන යම් හෝ සීමිත විවේචනයක් පවා රාජද්‍රෝහිත්වයට සමාන බව යි. යථාර්ථය නම්, 1983 දී දිග්ගැසුනු සිවිල් යුද්ධය ආරම්භ කිරීමට වගකිව කිව යුතු දක්ෂිනාංශික එජාපය 2006 ජුලි මස පටන් මේ දක්වා මිලිටරි ආක්‍රමනයන්ට පූර්න පිටුබලය සපයා තිබීම යි. මිලිටරියේ වඩාත් ම කුප්‍රකට අපයෝජනයන් පිලිබඳව කෙරෙන ඇල්මැරුනු විවේචන හැරුනු කොට, එක්සත් ජනපදය හා සෙසු අධිරාජ්‍යවාදී බලවතුන් ආන්ඩුවේ යුද්ධයට නිහඬව සහයෝගය දී ඇති අතර ආන්ඩුව විසින් 2002 සටන් විරාම ගිවිසුම ඉරා දමනු ලැබීම නොතකා හැර තිබේ.

නව දේශපාලන පෙරමුනක් දියත් කිරීමේ සිය සැලසුම්වලට බෞද්ධ ධූරාවලියේ ආශිර්වාද ලබා ගනු වස් වීරවංශ ඉරිදා මහනුවර සංචාරයක යෙදුනි. ඉන් අනතුරුව කල කතාවක දී, ඔහු සිය විරුද්ධවාදීන් එල්ටීටීඊයේ ඒජන්තයන් යැයි වඩාත් රුදුරු ලෙස හෙලා දැක්කේ ය. “රටේ ජාතික නායකත්වය විනාශ කිරීමේ කුමන්ත්‍රනයක් පවතිනවා. එල්ටීටීඊය එය ඉදිරියට ගෙන යනවා. බෙදුම්වාදයට උඩ ගෙඩි දෙන අය ජවිපෙ භේද කිරීමට සම්මාදම් වී තියෙනවා. රටේ බෙදුම්වාදයට උඩ ගෙඩි දෙන බලවේගවලට සහයෝගය දෙන අය අද සතුටු වෙනවා.” යයි ඔහු පැවසී ය.

## ජවිපෙ නායකයෝ

ජවිපෙ තුල විමල් වීරවංශගේ විරුද්ධවාදීහු ද ඔහු මෙන්ම සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටිති. එහෙත්, ඒ සමග ම ආන්ඩුව සමග සම්බන්ධ වුව හොත් පක්ෂයට ඉතිරිව පවතින සහයෝගය ද වාෂ්ප වී යනු ඇතැයි ඔවුහු දැඩි කනස්සල්ලට පත්ව සිටිති. පක්ෂයේ දේශපාලන පිලිවෙත අනුගමනය කිරීමට අසමත්වීම සහ රාජපක්ෂ ආන්ඩුව කෙරෙහි වඩාත් විවේචනශීලි ආකල්පයක් ගැනීමට අසමත්වීම සම්බන්ධව වීරවංශට එරෙහිව විනයානුකූල පියවර ගෙන ඇත.

ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ අප්‍රේල් 9 පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී වීරවංශ ආන්ඩුව විවේචනය කිරීමට අසමත්වූ ප්‍රශ්න වැලක් ඉදිරිපත් කලේ ය. 2007 ජූනි මාසයේ දී පොලීසිය විසින් දෙමල ජනයා සිය ගනනක් බලහත්කාරයෙන් කොලඹින් ඉවත් කිරීම, ඉහල යන ජීවන වියදම සහ ආන්ඩුව ගැන විවේචනශීලී පත්‍රයක් වන සන්ඩේ ලීඩර් හි මුද්‍රනාලයට ගිනි තැබීම ද ඊට ඇතුලත් විය.

ජවිපෙ ප්‍රකාශනයක් වන ලංකා පුවත්පතේ අප්‍රේල් 20 කලාපය සමග සම්මුඛ සාකච්ඡාවක දී පක්ෂය “මහින්ද රාජපක්ෂට ගැට ගැසීමට” උත්සාහ කරමින් සිටින බවට ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා වීරවංශට චෝදනා කලේ ය. ආන්ඩුවට “අවශ්‍යවුනා ජනතා විමුක්ති පෙරමුන තමන්ගේ සාක්කුවේ දමාගන්න .... පක්ෂය ඇතුලතින් පාලනය කිරීමට විමල් (වීරවංශ) යොදාගත් බවට අපට සැකයක් තියෙනවා... ඒක අසාර්ථක උනහම තමයි ඒගොල්ලෝ මැදිහත්වෙලා විමල්ව ගලවාගත්තේ” යැයි ඔහු ප්‍රකාශ කලේය. වීරවංශ තරමට ම දැඩි ලෙස ජවිපෙ ද යුද්ධයට සහයෝගය දෙයි. සිල්වා ලංකා පත්‍රයට මෙසේ පැවසීය: “මේ රටේ බරපතල ප්‍රශ්න කිහිපයක් තියෙනවා. අපේ රටේ කේන්ද්‍රීය ප්‍රශ්නය ජාතික ගැටලුව... ජාතික ප්‍රශ්නය පදනම් කරගෙන අපේ රටට එල්ල වෙලා තියෙන බරපතල බටහිර කුමන්ත්‍රන, ඒවගේම ඉන්දියානු මැදිහත්වීම පරාජයට පත්කරන්න ඕනකම තියෙනවා.

ලංකාව කොසෝවක් ඈලියා ඇති පරිදිම% බවට සුඩානයක් බවට පත්වීම වලක්වන්න ඕනෑ.... රට ඇතුලෙ බරපතල ආර්ථික අර්බුදයක් තියෙනවා.... මේ ප්‍රශ්නවලට රාජපක්ෂ ආන්ඩුවට විසඳුමක් නැහැ. දේශප්‍රේමී සහ ප්‍රගතිශීලී නව දේශප්‍රේමී පෙරමුනක් අවශ්‍යයි."

සෑහෙන කාලයක් පක්ෂය තුල පැසවමින් තිබූ මෙම කලහය පුපුරා එලිමහනට ඒම අහම්බයක් නොවේ. උද්ධමනය අහස උසට නගින තතු තුල ගම්බද ප්‍රදේශවල ජවිපෙ සම්ප්‍රදායික පදනම ද අලලාගත් අතෘප්තියක් ඇවිලෙමින් පවත්නා බව ජවිපෙ නායකයෝ හොඳින් දනිති. රටේ ප්‍රධාන ආහාරය වන සහල් ඇතුලු අත්‍යවශ්‍ය භාන්ඩවල හිඟය පෙන්නුම් කරමින් ආහාර ද්‍රව්‍යවල වාර්ෂික උද්ධමනය මාර්තු මාසයේ දී සියයට 37 තරම් දැරිය නොහැකි මට්ටමකට ඉහල නැගුනි.

පසුගිය වසරේ නැගෙනහිර පලාතේ දී එල්ටීටීඊයට එරෙහිව ලද සමහර ක්ෂනික ජයග්‍රහනයන්ගෙන් පසුව උතුරේ මිලිටරි මෙහෙයුම් මඩ වගුරක එරී ඇත. වැඩි කන්ඩායමක් හමුදාවට බඳවාගෙන ඇත්තේ රටේ සිංහලයන් වැඩි ගම්බද තරුන ජනයාගෙනි. අරමුදල් කප්පාදුව සහ වැටුප් පිලිබඳ විරෝධතා උද්ඝෝෂනවල නියැලි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහ රාජ්‍ය අංශයේ කම්කරුවෝ යුද ව්‍යායාමය සඳහා පරිත්‍යාග කරන ලෙස ඉල්ලා සිටින ජවිපෙ ශිෂ්‍ය සහ වෘත්තීය සමිති නායකයන් කෙරෙහි දැඩිව කලකිරී සිටිති. කම්කරුවන් ජවිපෙ සමිති අතහැර යාමට පටන් ගෙන ඇත. තම ශක්තිය ප්‍රදර්ශනය කිරීමට සම්ප්‍රදායිකව යොදා ගත් මැයි දින පෙලපාලිය මෙම වසරේ නොපැවැත්වීමට ජවිපෙ ගෙන ඇති තීන්දුව මෙම තත්වය පිලිබඳ ඇඟැවුමකි.

කොලඹ සහ ජාත්‍යන්තර ජනමාධ්‍යයන් ජවිපෙ " මාක්ස්වාදීන්" යයි නිතිපතා කියා පාන නමුත් එයට මාක්ස්වාදය හෝ සමාජවාදය සමඟ මොනම සම්බන්ධයක් කවරදා වත් තිබුනේ නැත. එය යොමු වූයේ දිලිඳු ගම්බද තරුනයන් වෙතට මිස කම්කරු පන්තිය වෙතට නොවේ. 1960 ගනන්වල දී එය ආරම්භ කල තැන් පටන් ජවිපෙ දෘෂ්ටිවාදය පදනම් වූයේ මාඕවාදය, කස්ත්‍රෝවාදය සහ සිංහල වර්ගවාදී දේශපාලන සම්මිශ්‍රනයක් මත ය. මෙය රටතුල සිවිල් යුද්ධයේ බලපෑම යටතේ වේගයෙන් දකුනට ගියේ ය.

එල්ටීටීඊය මර්දනය කිරීම සඳහා ඉන්දියානු " සාමසාධක හමුදාවලට" උතුරට පැමිනීමට ඉඩ දීමට එකඟ වූ සාම ගිවිසුමක් ක්‍රියාවට දැමීම මගින් රට පාවා දුන්නේ යයි එජාප ආන්ඩුවට චෝදනා කරමින් ජවිපෙ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව 1980 දශකයේ අග භාගයේ දී "දේශප්‍රේමී" උද්ඝෝෂනයක් දියත් කලේ ය. ජවිපෙ ෆැසිස්ට් කල්ලි ජවිපෙ වර්ගවාදී දේශපාලනයට සහයෝගය දීම ප්‍රතික්ෂේප කල සිය ගනනක් කම්කරුවන් හා දේශපාලන විරුද්ධවාදීන් මරා දැමූහ. ජවිපෙ සමග සන්ධාන ගත වීමට ටික කලක් සලකා බලමින් සිටි ජනාධිපති ආර් ප්‍රේමදාස 1989 දී පක්ෂය මත කඩා පැන එහි නායකයන් මරා දමා ඉක්බිතිව ගම්බද තරුනයන් දස දහස් ගනනක් ඝාතනය කල මිනීමරු හමුදාව දකුන පුරාම ලිහා හැරියේ ය.

චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපති තනතුරට පත් වූ 1994 ජනාධිපතිවරනයෙන් පසුව ජවිපෙ යලි ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට එකතු විය. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට - එජාප සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - එරෙහිව විරුද්ධත්වය වර්ධනය වූ කල්හි දේශපාලන විරෝධය නොමග යැවීමේ ආරක්ෂක කපාටයක් ලෙස පාලක ප්‍රභූවට ජවිපෙ වටිනා කාර්යභාරයක් ඉටු කර දුනි. එහෙත්, එය 2004 ශ්‍රීලනිපය නායකත්වය දුන් ආන්ඩුවට සම්බන්ධවීම නිසා ද දිලිඳු ජනයාට උදව් කිරීමේ කිසිදු පොරොන්දුවක් ඉටු කිරීමට අසමත් වූ නිසා ද ජවිපෙට බහින කලාව එලඹුනි.

මෙසේ මහජන සහයෝගය බිඳ වැටුනු තතු තුල, 2004 දෙසැම්බර් මාසයේ සුනාමියට ගොදුරුවූවන් සඳහා ජාත්‍යන්තර ආධාර බෙදාදීමට එල්ටීටීඊය සමග ඒකාබද්ධ මන්ඩලයක් (පී-ටොම්ස්) පිහිටුවීමට දැඩි ලෙස විරුද්ධ වෙමින් ජවිපෙ කුමාරතුංග ආන්ඩුවෙන් ඉවත් විය. සුනාමි ආධාර මංඩලය ප්‍රතික්ෂේප කිරීමත් සමග එල්ටීටීඊයට විරුද්ධ යුද්ධයක් යලි ආරම්භ කිරීම සඳහා වර්ගවාදී මනෝගතියක් ඇවිස්සීමේ උද්ඝෝෂනයක් අරඹන ලදී. තමන්ට සහයෝගයක් ලැබේ දැයි ජවිපෙට සහතිකයක් නොතිබුනු තතු තුල 2005 පැවති ජනාධිපතිවරනයට ඉදිරිපත් නොවූ ජවිපෙ එනමුත් යුද්ධය ආරම්භ කිරීමේ වැඩපිලිවෙලක් උඩ කුමාරතුංග ඉවත් කොට පත්වූ රාජපක්ෂට සහය දුන්නේ ය.

භේදයක් කරා ම ගමන් කර ඇති වත්මන් අර්බුදය ජවිපෙ සාමාජිකයන් අතර අවුලුවා ඇත්තේ පක්ෂ සාමාජිකත්වය ද පලල් සහයෝගය ද බිඳවැටී ඇති හෙයිනි. ඉරිදා මහනුවර දී තම අදහස් ප්‍රකාශ කල වීරවංශ "පක්ෂය තුල පිරියම් කිරීමකට ඉඩක්" නැති බව පිලිගත්තේ ය.

© www.wsws.org